**Office Use Only**

## <u>පර්යේෂණ සඳහා මෘත ශරීර වෛද්‍ය පීඨයට ප්‍රදානය කිරීම.</u>

## <u>(දේහය ඥාතීන් / භාරකරුවන් විසින් දැන්විය යුතු ප්‍රකාශ පත්‍රය).</u>

1 අ. මිය ගිය තැනැත්තා / තැනැත්තියගේ සම්පූර්ණ නම :

..........................................................................................................................................

ආ. මිය යන විට වයස : ..........................................................................................................

ඇ. මරණය සිදු වූ දිනය :..........................................................................................................

ඈ. මරණය සිදු වූ ස්ථානය : ..........................................................................................................

ඉ. මරණය සිදු වී ඇති ආකාරය : ..........................................................................................................

ඊ. මරණයට හේතුව සහතික කරන

i. වෛද්‍ය නිළධාරියා : ..........................................................................................................
ඔහු / ඇයගේ ලිපිනය : ..........................................................................................................

ii. මරණ පරීක්ෂක : ..........................................................................................................
ඔහු / ඇයගේ ලිපිනය : ..........................................................................................................

2 අ. දේහය පීඨයට භාරදුන් තැනැත්තා / තැනැත්තියගේ

i සම්පූර්ණ නම :..........................................................................................................

ii ලිපිනය : ..........................................................................................................

ආ. ඔහුගේ මිය ගිය අයට දක්වන ඥාති සම්බන්ධය / භාරකාරත්වය: ......................................................

ඇ. දේහය සවරක්ෂණය (එම්බාම්) කරනු ලැබුවේ නම්

i. ඒ කවර ස්ථානයක්ද : ..........................................................................................................
ii. පීඨයෙන් නිකුත් කළ පත්‍රිකාවේ සඳහන් උපදෙස් මතද : ................................................
iii. වෙනත් ආකාරයකින්ද : ..........................................................................................................

අත්සන : ..........................................................................

නම : ..........................................................................

ජාතික හැඳුනුම්පත් අංකය : ......................................

ඈ. මෘත දේහය පීඨාධිපති වෙනුවෙන් භාරගත් නිළධාරියාගේ නම : ..........................................................

මෙම ප්‍රකාශය සමග භාර දිය යුතු සහතික / ලියවිලි

- මරණ සහතිකයේ පිටපතක් - අනිවාර්යයි.
- රෝග සහතික පත්‍ර (Diagnosis Card)

කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය

වෛද්‍ය පීඨය

කඳවලවත්ත

රත්මලාන

20..................................

ස්වාමින්වහන්සේ පූජකතුමනි,

මහත්මයාණෙනි / මහත්මියනි / මෙනවියනි,

**<u>වෛද්‍ය පර්යේෂණ සඳහා කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාල වෛද්‍ය පීඨයට මෘතදේහ පරිත්‍යාග කිරීම.</u>**

මරණින් මතු ඔබේ දේහය වෛද්‍ය පර්යේෂණ සඳහා ප්‍රදානය කිරීමට ඔබ තුළ ඇති පරමාර්ථ බෙහෙවින් අගය කරමින් මෘත දේහයන් ප්‍රදානය කිරීමේදී සැලකිළිමත් විය යුතු කරුණු ඔබ වෙත ඉදිරිපත් කරමි. මරණින් පසු දේහයක අයිතිය ඥාතීන් හෝ භාරකරුවන් සතුවන බැවින් ඔබ මෙන්ම ඔවුන්ද පහත සඳහන් උපදෙස් පිළිපැදීම / දැනුවත් වී තිබීම ඉතා වැදගත් වනු ඇත.

01. මෘත දේහ ප්‍රදානය කිරීමට පොරොන්දු පත්‍රයක් හෝ ලිඛිත ගිවිසුමක් වෛද්‍ය පීඨය විසින් නිකුත් නොකරන අතර දේහය ප්‍රදානය කිරීමට බලාපොරොත්තු වන්නේ නම් ලිඛිත හෝ වාචික කැමැත්ත තම ඥාතීන් හෝ භාරකරුවන් විසින් දන්වා සිටීම ප්‍රමාණවත් වේ. එසේම, අවශ්‍ය නම් වෛද්‍ය පීඨයේ පීඨාධිපති වෙත ලිපියක් මගින් තම කැමැත්ත ප්‍රකාශ කල හැක. නමුත් මිය ගිය පසු දේහය ප්‍රදානය කිරීම සිදු කරන්නේ ඥාතීන් භාරකරුවන් බැවින් මේ කැමැත්ත පිළබඳව ඔවුන් දැනුවත් කර තිබීම ඉතා වැදගත් වේ.

02. i. මෘතදේහ ප්‍රදානය කිරීමට අදහස් කළ අයෙකු මිය ගිය විගසම, ඒ බව ඥාතීන් / භාරකරුවන් විසින් රජයේ වැඩ කරන ඕනෑම දිනක පෙ. ව. 8.00 සිට ප.ව. 4.00 දක්වා ඉහත ලිපිනයේ පිහිටි කායව්‍යවච්ඡේද විද්‍යා අධ්‍යනාංශයට පැමිණ දැන්වීමෙන් ඒ සඳහා අවශ්‍ය ලිපි ලේඛන වලට අත්සන් තැබීම ඇතුළු අනෙකුත් පහසුකම් සලසා ගත හැක.

ii. රජයේ නිවාඩු දින හා සති අන්ත දිනවල ආයතනය වසා ඇති නමුත් කලින් සාකච්ඡා කරගත් විට එම දිනයකදී වුවද දේහයන් භාර ගැනිමට කටයුතු කරනු ලැබේ.

03. i. මරණය සිදු වී පැය 24ක් ඇතුළත දේහය භාර දෙන්නේ නම්, දේහය ශ්වරක්ෂණය (එම්බාම්) කිරීම අවශ්‍ය නොවේ.

ii. ශ්වරක්ෂණය පහත ආකාරයට සිදු කල දේහයක් වුවද මරණය සිදු වී පැය 72 ක් ඇතුළත අධ්‍යනාංශයට භාර දිය යුතු බව කාරුණිකව සිහිපත් කරමි.

04. දේහය ශ්වරක්ෂණය කරන තැනැත්තාට / අවමංගල්‍යය සේවා ආයතනයට පහත සඳහන් උපදෙස් දෙන මෙන් ඉල්ලමි.

i. ශ්වරක්ෂණය කල යුත්තේ පාදයේ කලවා පෙදෙසේ ඉහල කොටසේ ඇති ප්‍රධාන ශිරාව (femoral vein) කැපීමෙනි.

ii. ශරීරයේ අවයවයන් ඉවත් කිරීම හෝ වෙනත් කොටසක කැපීම සිදු නොකල යුතුය. (ඇස් දන්දීම පමණක් කල හැකිය.)

iii. ශ්වරක්ෂණය කිරීමේදී 40% ෆෝමලින් ද්‍රාවනයකින් අවම වශයෙන් ලීටර දෙකක් (02) වත් ඉහත සඳහන් රුධිර නාලය තුලින් දේහයට ඇතුළු කල යුතුය.

**ඉහත සඳහන් ආකාරය හැර <u>වෙනත් ආකාරයකට ශ්වරක්ෂණය කළ දේහයක් කිසිම අන්දමකින් වෛද්‍ය පීඨයට භාර නොගන්නා බව සැලකිල්ලට ගත යුතු බව දන්වමි.</u>**

05. දේහය වෛද්‍ය පීඨයට භාර දීමේදී **<u>අනිවාර්යයෙන්</u>** සැළකිය යුතු කරුණු

i. දේහය භාර දෙන ඥාතීන් හෝ භාරකරුවන් සිය හැදුනුම්පත සමග ඉදිරිපත් විය යුතුය.

ii. මරණය ලියාපදිංචි කිරීමේ සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කල යුතුය.

iii. දේහය සිය කැමැත්තෙන් පීඨයට ප්‍රදානය කරන බව ඥාතීන් හෝ භාරකරුවන් විසින් ලිඛිතව ප්‍රකාශ කළ යුතුය.

06. ඉතා සැලකිය යුතුය.

අ. පහත සඳහන් ආබාධ හෝ ආසාදන ඇති දේහයන් වෛද්‍ය පීඨයට භාර නොගන්නා බව කරුණිකව සැලකිය යුතුය.

i. දිගුකල් පැවති ඇඳ තුවාල තිබීම. (Bed Sores)

ii. හදිසි අනතුරකට භාජනය වී දැඩි ලෙස තුවාල ලබා සිටීම.

iii. බරපතල ශල්‍යකර්මවලට භාජනය වී අවයව, ඉන්ද්‍රියන් ඉවත් කර තිබීම.

ආ. මියගිය පසු පශ්චාත් මරණ පරීක්ෂණයකදී දේහය ව්‍යවච්ජේදනය කර තිබීම.

එබඳු මෘත දේහයක් වෛද්‍ය පීඨයට ලබා දීමෙන් වැළකී සිටින්න. දේහයක් පීඨයට භාර දීම පිළිබඳව සාකච්ජා කිරීමට දේහයේ ඥාතීන් හෝ භාරකරුවන් පැමිණි විට දේහයේ තත්ත්වය අනුව භාර ගැනීමට සුදුසු / නුසුදුසු බව දන්වනු ලැබේ. වෛද්‍ය පර්යේෂණ සඳහා භාවිත වන්නේ සාමාන්‍ය දේහයන් වන බැවින් ඉහත ආකාරයේ දේහයන්ගෙන් වෛද්‍ය පීඨයට ප්‍රයෝජනයක් නොවනු ඇත.

ඇ. නමුත් ඉහත සඳහන් කළ (i, ii, iii) තත්ත්වයේ දේහයක් සත්‍ය තත්වය වසන් කර පීඨයට ගෙන ආ විට එය පීඨය විසින් ආපසු හරවා නොයවන මුත් එය භාරගෙන පීඨය මගින් සුසාන භූමියක වල දැමීමට අදාල බලධාරීන්ට සිදුවන අතර එමගින් මිය ගිය අයට අගෞරවයක්ද සිදුවන බව දැන්වීමට කැමැත්තෙමි. එබැවින් එවැනි සිදුවීම් වැළැක්වීමට දේහයේ භාරකරුවන් කල්පනාකාරී විය යුතුය.

7. ඔබට මේ පිළිබඳ වැඩිදුර විස්තර හෝ පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් සතියේ වැඩ කරන දිනක දුරකථන අංක 0718151961 මගින් කාර්මික නිළධාරීන් හෝ අංක 0718002880 මගින් කාය කායච්ඡේද (Anatomy) අධ්‍යයන අංශ ප්‍රධානී අමතන්න. මරණය සිදුවූයේ නිවාඩු දිනයකදී නම් පීඨය වසා ඇති බැවින් කාර්මික නිළධාරීන් හමුවීම හෝ දුරකථනයෙන් සාකච්ඡා කිරීම කළ නොහැක. එවැනි විශේෂ අවස්ථාවක දුරකථනයෙන් අධ්‍යයනාංශ ප්‍රධාන වෙත ඇමතීමෙන් ඔබගේ ප්‍රශ්නය නිරාකරණය කරගත හැකි වීමට ඉඩ තිබේ. නමුත් එවැනි නිවාඩු කාලයකදී අධ්‍යයනාංශ ප්‍රධාන හමු නොවීමටද ඉඩ ඇති බව දන්වමි.

8. දේහය භාරදීමේද පහත සඳහන් ලේඛනයන් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

   i. මියගිය තැනැත්තාගේ මරණ සහතිකයේ පිටපතක් (මරණ සහතිකය සමග ඉදිරිපත් කල යුතුය).

   ii. දේහය භාරදෙන තැනැත්තාගේ ජාතික හැඳුනුම්පත / රියදුරු බලපත්‍රය හෝ විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්.

   (රෝග නිශ්චය සහතික පත්‍රය ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවන අතර එය තිබේ නම් ඉදිරිපත් කිරීමට කාරුණික වන්න).

9. මෘතදේහය භාර දීමට පැමිණෙන පුද්ගලයන් පහත දැක්වෙන කරුණු කෙරෙහි තම අවධානය යොමු කළ යුතුය.

   i. වෛද්‍ය පීඨය විසින් ප්‍රවාහන පහසුකම් සපයනු නොලැබේ.
   ii. වෛද්‍ය පීඨය විසින් දේහයක් භාර ගත් පසු කිසිම හේතුවක් නිසා නැවත දැක බලා ගැනීමට කිසිවෙකුට අවසර නොදෙන බව දන්වමි.
   iii. පීඨය තුළ ආගමික වතාවත් හෝ වෙනයම් උත්සවයක් පැවැත්වීමට ඉඩ දෙනු නොලැබේ.
   iv. දේහයේ කිසිම කොටසක් ඥාතීන්ට හෝ භාරකරුට නැවත ලබා දෙනු නොලැබේ.
   v. දේහය ප්‍රදානය කිරීම වෙනුවෙන් පීඨය කිසිම ගාස්තු ගෙවීමක් සිදුකරනු නොලැබේ.
   vi. දේහය භාරදෙන අවස්ථාවේදී අදාළ භූමිය හෝ එම ස්ථානයේ පසුබිම ඡායාරූපයට නැගීමට ඉඩදෙනු නොලැබේ. විශ්ව විද්‍යාලය තුළ ඡායාරූප ගැනීමට අවසරයක් නොමැත.
   vii. දේහය භාරදීමට පැමිණෙන පිරිස උපරිම වශයෙන් 25කට සීමා කිරීමට කාරුණික වන්න.
   viii. දේහය භාරදීමෙන් පසු දේහය බහලු පෙට්ටිය නැවත ලබාදෙනු ලැබේ.

ස්තූතියි.

මෙයට,

.....................................................

පීඨාධිපති / වෛද්‍ය

**දේහය භාරදීමට පැමිණෙන ඥාතීන් පිළි පැදිය යුතු උපදෙස් :**

- පෙරවරු 8.00 සිට සවස 4.00 දක්වා පමණක් මෘත ශරීර භාරගනු ලැබේ.
  (සවස 4න් පසුව මෘත ශරීරය ලබාදීමට අවශ්‍ය නම් කලින් අවසර ලබාගත යුතුය).
- දේහය භාරගනු ලබන්නේ කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ කායච්ඡේද අංශයේ දේහ සංරක්ෂණ අංගනයේදිය.(Embalming Room)
- දේහය භාරදීමට පැමිණෙන පිරිස උපරිම වශයෙන් 25කට සීමා කිරීමට කාරුණික වන්න.
- විශ්ව විද්‍යාල භූමිය තුල ආගමික වතාවත් සිදුකිරීමට අවසර නොලැබේ.
- දේහය රැගෙන එන පිරිස විශ්ව විද්‍යාල භූමිය තුල රැදී සිටින උපරිම කාලය විනාඩි 45කට සීමා කල යුතුය.
- පැමිණෙන පිරිසට දේහය අඩංගු පෙට්ටිය විවෘත කර අවසාන ගෞරව දැක්වීමට අවස්ථාව සලසාගත හැක.
- දේහය භාරදීමේ පෙරහැර ඇතුලු විය යුත්තේ පිහිනුම් තටාකය අසල ඇති දොරටුවෙනි.
- දේහය භාරදෙන අවස්ථාවේදි සහ විශ්ව විද්‍යාලය තුලදි ඡායාරූප ගැනීමට අවසර නැති බව සලකන්න.

**පැමිණෙන මාර්ගය:**

